සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

කතෝලික ධර්මය I, II
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

## කතෝලික ධර්මය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) මිනිසා, මැවිලි අතර උතුම්ම මැවිල්ල වීමට හේතු **දෙකක්** ලියන්න.
(ii) ශුද්ධ වූ පාවුලුතුමා පවසන ආකාරයට මිනිසා තුළ පවතින ශරීර **දෙක** මොනවා ද?
(iii) මුල් කිතුනු සභාවේ ලක්ෂණ **දෙකක්** ලියන්න.
(iv) ජනවන්දනාවේ ප්‍රධාන අංශ **දෙකක්** නම් කරන්න.
(v) ජලයෙන් බෞතිස්මය නොලැබුවත් දේව රාජ්‍යයට පිවිසිය හැකි පුද්ගල කාණ්ඩ **දෙකක්** නම් කරන්න.
(vi) ඉතිහාසය තුළ දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට අනාවරණය වූ අයුරු පිළිබඳව උදාහරණ **දෙකක්** ලියන්න.
(vii) සමගි සන්ධානයේ ප්‍රසාද නිධානයට භාවිත කරන වෙනත් නම් **දෙකක්** ලියන්න.
(viii) ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද දෝවනය කිරීමෙන් අපට ගත හැකි ආදර්ශ **දෙකක්** සඳහන් කරන්න.
(ix) ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා **දෙකක්** ලියන්න.
(x) ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු මණ්ඩලය විසින් අනුමත කර ඇති ණය මංගල්‍ය දින **දෙකක්** සඳහන් කරන්න.

**2.** (i) ජනතා සේවයේ ප්‍රසාද නිධාන **දෙක** සඳහන් කරන්න.
(ii) කිතුනුවන් ලෙස ආරම්භක ප්‍රසාද නිධාන ලබා ගැනීමෙන් අප ජීවිතය තුළ ඇති වන වෙනස්කම් **තුනක්** ලියන්න.
(iii) නික්මයාම ගමන තුළ ඊශ්‍රායෙල් ජනතාව දේව සංරක්ෂණය අත් දුටු ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

**3.** (i) දස පනතේ අන්තර්ගත වී ඇති මූලික ඉගැන්වීම් **දෙක** ලියන්න.
(ii) කන්ද උඩ දේශනාව තුළින් ක්‍රිස්තුන් වහන්සේ උගන්වා වදාළ භාග්‍ය **තුනක්** සඳහන් කරන්න.
(iii) භාග්‍යයන් තුළින් දේව රාජ්‍යය කරා කැඳවීම හා එම කැඳවීම ජීවිතයට සම්බන්ධ කර ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

**4.** (i) ලන්දේසි පාලන සමය තුළ කතෝලික විශ්වාස රැක ගැනීමට පුරෝගාමී වූ ඔරතෝරියානු පියවරු විසින් සිදු කළ සේවා **දෙකක්** ලියන්න.
(ii) ලන්දේසීන් විසින් කතෝලිකයින්ට ඇති කළ පීඩන ප්‍රතිපත්ති **තුනක්** සඳහන් කරන්න.
(iii) කිතුනු දරුවෙකු ලෙස කතෝලික විශ්වාසය රැක ගැනීමට ඔබේ මීසම තුළ ඔබට කළ හැකි ක්‍රියාකාරකම් **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

**5.** (i) නිරන්තර යාච්ඤාවේ යෙදීමට ඇති බාධා **දෙකක්** ලියන්න.
(ii) ශුද්ධ වූ සභාව අපට උගන්වනු ලබන පොදු යාච්ඤා **තුනක්** සඳහන් කරන්න.
(iii) රෝගීව සිටින ඔබේ මිතුරෙකුට ඉක්මන් සුවය පතා කළ හැකි යාච්ඤාවක් ලියන්න.

**6.** (i) දෙවන වතිකාන කතිකාවට අනුව පැවිදි පන්ති මුල්තැන දිය යුතු පැතිකඩ **දෙකක්** නම් කරන්න.
(ii) ශ්‍රී ලංකාවට පැමිණි තාපස නිකායවලට අයත් ධර්මදූතවරුන් විසින් සිදු කරන ලද සේවා **තුනක්** නම් කරන්න.
(iii) "තාපස ජීවිතය මෙලොව භාග්‍යවන්ත තත්ත්වයකි." මේ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.
(i) ශුද්ධ වූ ජුසේවාස් පියතුමා ශුද්ධවරයට එසවීම
(ii) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා
(iii) පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව
(iv) දේව මැවිල්ල වූ ස්වභාව ධර්මය සුරකිමු
(v) ප්‍රසාද ස්නාපනයෙන් ලැබෙන වරප්‍රසාද

* * *

Department of Examinations Sri Lanka

**25.** ශුද්ධාත්මයාණන් වහන්සේ අපෝස්තුළුවරුන් වෙත වැඩම කළේ,
(1) මහා බ්‍රහස්පතින්දා ය. (2) ස්වර්ගාරෝහණ දිනයේ දී ය.
(3) පෙන්තකොස්ත දිනයේ දී ය. (4) ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍ය දිනයේ දී ය.

**26.** ශුද්ධාත්මයාණන්ගෙන් පෝෂණය වූ කිතුනු අපට ලැබෙන ආධ්‍යාත්මික දීමනාවක් වන්නේ,
(1) අන් අය අනුකරණය කිරීමේ හැකියාවයි.
(2) යම් කෙනෙකුට පක්ෂව සේවය කිරීමේ හැකියාවයි.
(3) දිවැස්වැකි කීමේ වරයයි.
(4) අන් අය විවේචනය කිරීමේ හැකියාවයි.

**27.** ශුද්ධ වූ පාවුලුතුමා ගලාති හසුනේ (5 :22-23) වගන්තියේ කිතුනු අපට අන් අය දරා ගැනීමට, සමාව දීමට හැකියාව ලබා දෙන ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඵලයක් බවට සඳහන් කරන්නේ,
(1) ඉවසීමයි. (2) පරිත්‍යාගයයි. (3) ස්වදමනයයි. (4) ආත්ම ශක්තියයි.

**28.** දිව්‍ය සත්ප්‍රසාදීය යාගය නමැති ප්‍රසාද නිධානය හඳුන්වන තවත් නාමක් වන්නේ,
(1) ලෞකිකත්වයේ භෝජනයයි. (2) අන්‍ය ජාතීන්ගේ භෝජනයයි.
(3) කුසගිනි නොවන භෝජනයයි. (4) සහභාගිකමේ භෝජනයයි.

**29.** විවාහ බන්ධනයේ අඛණ්ඩභාවය පිළිබඳව ශුද්ධ වූ මාක් සුවිශේෂයෙහි සඳහන් වන විශේෂ වගන්තිය කුමක් ද?
(1) මිනිසා තනිව විසීම සුදුසු නැත.
(2) දෙවියන් වහන්සේ විසින් එක් කළ අය මනුෂ්‍යා විසින් වෙන් නොකෙරේවා!
(3) පුරුෂයා හා ස්ත්‍රිය ලෙස ඔවුන් මැවූ සේක.
(4) ඔවුන් දෙදෙනා එකම ශරීරයක් වන්නේ ය.

**30.** පුරාණ ගිවිසුමේ සඳහන් මුල් ම පූජකවරයා,
(1) මෙල්කිසෙදෙක් ය. (2) සෙකරියස් ය. (3) සිමියොන් ය. (4) සාවුල් ය.

**31.** පැවිදි චේදභාර ත්‍රිත්වය නම්,
(1) බැහැපත්කම, කීකරුකම හා දිළිඳුකම ය. (2) නිර්භීතකම, කීකරුකම හා දිළිඳුකම ය.
(3) ව්‍රත ශුද්ධිය. දිළිඳුකම හා කීකරුකම ය. (4) දිළිඳුකම, ව්‍රත ශුද්ධිය හා නිර්භීතකම ය.

**32.** භාවනාශීලී සහ ගැඹුරු යාච්ඤාවට යොමු වූ තාපස නිකායක් වන්නේ,
(1) මහා කාර්මෙල් නිකාය ය. (2) කන්‍යා මරියතුමියගේ සහෝදරියෝ ය.
(3) දිළිඳුන්ගේ කුඩා සොහොයුරියෝ ය. (4) දේවාරක්ෂාවේ පැවිදි නිකාය ය.

**33.** "අනුන් සතු දේ සොරකම් නොකළ යුතු ය" යන ඉගැන්වීමට අදාළ දේව පනත් වනුයේ,
(1) 4 සහ 8 ය. (2) 5 සහ 7 ය. (3) 6 සහ 9 ය. (4) 7 සහ 10 ය.

**34.** දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු ලබන්නේ,
(1) තෘප්තිය ය. (2) සැනසීම ය. (3) ස්වර්ග රාජ්‍යය ය. (4) දයාව ය.

**35.** "භාග්‍යවන්තයෝ" යන්න ග්‍රීක භාෂාවෙන් කියැවෙන වචනය තෝරන්න.
(1) බාසිලෙයියා (2) එක්ලෙසියා (3) ප්‍රොපෙටේස් (4) මකාරියෝ

**36.** කිතුනු අප තුළ නිහතමානී ගුණ තිබීම නිසා,
(1) කිතුනු අනුගාමිකයෙකු ලෙස කටයුතු කළ හැකි වේ.
(2) සියල්ලන්ගේ සිත් දිනාගත හැකි වේ.
(3) දෙවියන් තුළ ජීවත්වීමට උපකාරී වේ.
(4) දේව විශ්වාසය වර්ධනය කර ගැනීමට හැකි වේ.

**37.** යාච්ඤාව උගන්වන පළමු පාසල වන්නේ,
(1) දහම් පාසල ය. (2) කිතුනු පවුල ය. (3) පාසල ය. (4) දේවස්ථානය ය.

**38.** දිනපතා පවුලේ සියලු දෙනා සමඟ එකතු වී ජපමාලය උච්චාරණය කිරීම,
(1) පෞද්ගලික යාච්ඤාවයි. (2) භාවනා මෙහෙයකි.
(3) විශ්වාසීන්ගේ යැදුමකි. (4) පොදු යාච්ඤාවයි.

**39.** නව ගිවිසුම තුළ ස්වාමිවාක් ආරාධනාව හා සමානකම් දක්වන අනෙක් යාච්ඤාව,
(1) විශ්වාස ලක්ෂණයයි. (2) ස්තෝත්‍රික යාගයයි.
(3) උත්තම පූජක යැදුමයි. (4) දයාධික මනස්ථාපනයයි.

**40.** ක්‍රිස්තුන් වහන්සේ තමා 'දේව පුත්‍රයා' ලෙස පැහැදිලිව පැවසූ බව තම සුවිශේෂයේ සඳහන් කරන්නේ,
(1) ශුද්ධ වූ ජොහන් ය. (2) ශුද්ධ වූ ලූක් ය. (3) ශුද්ධ වු මාක් ය. (4) ශුද්ධ වූ මතෙව් ය.

* *

[හතරවැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka

**10.** නව ගිවිසුමේ සඳහන් නිකදේමුස්,
(1) පරිසිවරයෙකි. (2) ජුදෙව් නායක පූජකයෙකි.
(3) අයකැමියෙකි. (4) විනයධරයෙකි.

**11.** ආරම්භ ප්‍රසාද නිධාන අනුපිළිවෙළට සඳහන් වන්නේ කුමන වරණයේ ද?
(1) අභිවෘද්ධි ආලේපය, පාපෝච්චාරණය, පූජකවරය
(2) ප්‍රසාද ස්නාපනය, දිව්‍ය සත්ප්‍රසාදය, අභිවෘද්ධි ආලේපය
(3) දිව්‍ය සත්ප්‍රසාදය, ආශිර්වාදකාර බන්ධනය, ප්‍රසාද ස්නාපනය
(4) ප්‍රසාද ස්නාපනය, පූජකවරය, අභිවෘද්ධි ආලේපය

**12.** දිව්‍ය සත්ප්‍රසාදය යනු,
(1) ශරීරය පෝෂණයට භෞතික ආහාරයකි.
(2) ස්තුති කිරීමකි.
(3) ආධ්‍යාත්මික පෝෂණය සඳහා භෞතික ආහාරයකි.
(4) ශුද්ධාත්ම එල අතරින් ප්‍රධානත්වය ගනු ලබන්නකි.

**13.** ආශිර්වාදකාර බන්ධනය නමැති ප්‍රසාද නිධානය මඟින් හිමිවනුයේ,
(1) ඒකීය විශ්වාස ජීවිතයයි. (2) අචල බලාපොරොත්තුවයි.
(3) දේව ප්‍රේමයයි. (4) කිතුනු පවුල් ජීවිතයයි.

**14.** සමාජය ගොඩනැඟීමට ප්‍රධාන වන මූලික ඒකකය වන්නේ,
(1) මීසම් ජනතාව ය. (2) සභා නායකයින් ය. (3) පවුල ය. (4) මරිය හමුදාව ය.

**15.** අපෝස්තුළුවරුන් විසින් උපස්ථායකයින් පත් කර ගනු ලැබුවේ,
(1) දහම් දේශනා කිරීමට කාලය ලබා ගැනීමට ය.
(2) අපෝස්තුළුවරුන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීමට ය.
(3) ජනතාව ඉදිරියේ ආදර්ශමත් ලෙස ජීවත් වීමට ය.
(4) අපෝස්තුළුවරුන්ගේ නායකත්වය ප්‍රසිද්ධියට පත් කිරීමට ය.

**16.** පූජකවරය නමැති සක්‍රමේන්තුව ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද්දේ,
(1) පෙන්තකොස්ත දිනයේ දී ය. (2) ලෝකය මැවීමේ දී ය.
(3) ස්වර්ගාරෝහණය වූ දිනයේ දී ය. (4) අන්තිම රාත්‍රී භෝජනයේ දී ය.

**17.** ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුම තුළ දසපනත සඳහන් ග්‍රන්ථ දෙක මොනවා ද?
(1) උත්පත්ති සහ ගණන් කථාව (2) ගණන් කථාව සහ ලෙවී ව්‍යවස්ථාව
(3) ද්විතිය නීති සංග්‍රහය සහ නික්මයාම (4) ලෙවී ව්‍යවස්ථාව සහ උත්පත්ති

**18.** කතෝලික සභා ධර්මෝපදේශයට අනුව පුරාණ ගිවිසුමේ යාච්ඤාව පිළිබඳ වන සුවිශේෂ කෘතියක් වන්නේ කුමක් ද?
(1) ගණන් කථාව (2) ගීතාවලිය (3) ධර්මදේශකයා (4) හිතෝපදේශය

**19.** ශුද්ධ වූ සභාවේ යාච්ඤා ප්‍රභේද තුන වන්නේ මොනවා ද?
(1) වාචික, භාවනාව, ධ්‍යානයට සම වැදීම (2) වාචික, ලිඛිත, ධ්‍යානයට සම වැදීම
(3) භාවනාව, වාචික, ලිඛිත (4) ලිඛිත, ධ්‍යානයට සම වැදීම, භාවනාව

**20.** දෙවියන් වහන්සේ විශ්වය මැවීම තුළින් කිතුනු අපට ආරාධනා කරනුයේ,
(1) සොබා දහම ආරක්ෂා කර සංවර්ධනය කිරීමට ය.
(2) විශ්වාසයේ හා යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීමට ය.
(3) තමාගේ පෞද්ගලිකත්වය ත්‍යාග කර දේශය වෙනුවෙන් කැපවීමට ය.
(4) දෙවියන් වහන්සේගේ ප්‍රේමය හඳුනාගෙන ඊට ප්‍රතිප්‍රේමය දැක්වීමට ය.

**21.** ශුද්ධ බයිබලයේ උත්පත්ති පොතට අනුව මැවීමේ පළමු කථාව කුමන සම්ප්‍රදාය අනුව බිහි වී ඇත් ද?
(1) යාවේ සම්ප්‍රදාය (2) එලොහිම් සම්ප්‍රදාය (3) පූජක සම්ප්‍රදාය (4) ද්විතීය සම්ප්‍රදාය

**22.** "වචනය තෙම ද මාංශ වුණේ ය. අප සමඟ ද වාසය කළේ ය." යන වාක්‍ය අඩංගු කතෝලික සභාවේ තිල පොදු යැදුම වන්නේ කුමක් ද?
(1) නමෝ මරිය යාච්ඤාව (2) ස්වාමිවාක් ආරාධනාව
(3) යාම යැදුම (4) තුන් කාල ආරාධනාව

**23.** ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම රැක ගැනීමට පුරෝගාමීව කටයුතු කළ පැවිදි නිකාය කුමක් ද?
(1) ඔරතෝරියාන (2) දොමිනිකාන (3) ෆ්‍රැන්සිස්කාන (4) ජේසු නිකාය

**24.** ශ්‍රී ලංකා සහ සංස්කෘතිය දේශානුරූපී වීම සඳහා උර දුන් පුද්ගලයකු වන්නේ,
(1) ශුද්ධ වූ ෆ්‍රැන්සිස් සේවියර් මුනිතුමා ය. (2) ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා ය.
(3) ශුද්ධ වූ දලාසාල් මුනිතුමා ය. (4) දොන් ජුවන් ධර්මපාල රජතුමා ය.

/තුන්වැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka

0706

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

14 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| කතෝලික ධර්මය | I, II | පැය තුනයි |
| கத்தோலிக்கத் திருமறை | I, II | மூன்று மணித்தியாலம் |
| Catholicism | I, II | Three hours |

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. උත්පත්ති පොතේ දක්වන අන්දමට මිනිසා මවා ඇත්තේ,
(1) සියලු මැවිල්ල තමා කැමති ආකාරයට භුක්ති විඳීමට ය.
(2) සියලු මැවිල්ල පාලනය කර, තමාට ම පමණක් ප්‍රයෝජනයට ගැනීමට ය.
(3) ඉදිරිය ගැන නොසිතා එදිනෙදා ජීවත්වීමට ය.
(4) සියලු මැවිල්ල ආරක්ෂා කර, ප්‍රයෝජනයට ගනිමින් සංවර්ධනය කිරීමට ය.

2. දෙවන මැවීමේ කථාව අනුව මිනිසා භෞතික ලෝකයට අයත් වන්නේ,
(1) ඔහු තුළ හැඟීම් හා නිදහස ඇති නිසා ය. (2) ඔහු පොළොවේ දූවිල්ලෙන් මවා ඇති නිසා ය.
(3) ඔහු සෙසු සියලු මැවිලිවලට වඩා උසස් නිසා ය. (4) ඔහු ශාරීරිකව මෙලොව ජීවත් වන නිසා ය.

3. අහසේ ඇති තාරකා ගණන මෙන් දරු පරපුරක් ද, ස්ථිර දේශයක් ද දෙන බවට දෙවියන් වහන්සේ විසින් පොරොන්දු වී ගිවිසුමක් ඇති කරගනු ලැබුවේ,
(1) මෝසෙස්තුමා සමඟ ය. (2) ජාකොබ්තුමා සමඟ ය.
(3) ආබ්‍රහම්තුමා සමඟ ය. (4) ඊසාක්තුමා සමඟ ය.

4. රතු මුහුදෙන් එතෙර වීමේ සිද්ධිය අපට පැහැදිලි කරනුයේ,
(1) ජනතාවට දේව ආරක්ෂාව ලැබීමේ සලකුණක් බව ය.
(2) ජනතාව වහල් බවින් නිදහස් වීමේ සලකුණක් බව ය.
(3) මෙය තවත් එක් ජනකථාවක් බව ය.
(4) නව දේශයක් වෙත ජනතාව යොමු කරන බව ය.

5. ජනතාවට ගිවිසුම් ජීවිතය මතක් කර දෙමින්, දෙවියන් වහන්සේගේ පණිවිඩය ජනතාව අතරට ගෙන යාමට උන් වහන්සේ තෝරා ගත්තේ,
(1) දිවැසිවරුන් ය. (2) ජුදා නායක පූජකයන් ය.
(3) ඊශ්‍රායෙල් ජන නායකයන් ය. (4) ඊශ්‍රායෙල් රජවරුන් ය.

6. දෙවියන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ තුළ පූර්ණ වශයෙන් අනාවරණය වූ බව සඳහන්ව ඇත්තේ,
(1) ශුද්ධ වූ ජොහන් සුවිශේෂයේ ය. (2) එළිදරව් පොතේ ය.
(3) හෙබ්‍රෙව් හසුනේ ය. (4) රෝම හසුනේ ය.

7. ක්‍රිස්තුන් වහන්සේගේ සියලු ම ඉගැන්වීම්වල හරය මංගල වාක්‍ය වේ. එය අපට ඉදිරිපත් කරන්නේ,
(1) ශුද්ධ වූ මාක්තුමා සහ ශුද්ධ වූ ලූක්තුමා ය. (2) ශුද්ධ වූ මතෙව්තුමා සහ ශුද්ධ වූ ලූක්තුමා ය.
(3) ශුද්ධ වූ ලූක්තුමා සහ ශුද්ධ වූ ජොහන්තුමා ය. (4) ශුද්ධ වූ ජොහන්තුමා සහ ශුද්ධ වූ මාක්තුමා ය.

8. 'ශුද්ධාත්ම ඵල' ලෙස දැක්විය හැක්කේ මොනවා ද?
(1) ප්‍රේමය, බලාපොරොත්තුව, සාමය (2) ප්‍රඥාව, යහපත්කම, විශ්වාසවන්තකම
(3) නොබිඳෙන දිරිය, බලාපොරොත්තුව, ප්‍රීතිය (4) ඉවසීම, විශ්වාසවන්තකම, ප්‍රීතිය

9. මිනිස් සිරුරේ බොහෝ අවයව තිබුණත් ඒ සියල්ල එකම ශරීරයක් වන්නාක් මෙන් ශුද්ධ වූ සභාවේ කිතුනුවන් සැමදෙනා ක්‍රිස්තුන් වහන්සේ තුළ එකම ශරීරයක් වන බව ශුද්ධ වූ පාවුලුතුමා සඳහන් කර ඇති හසුන කුමක් ද?
(1) 1 කොරින්ති (2) 1 තෙසලෝනික (3) ගලාති (4) පිලෝමෙන්

[දෙවැනි පිටුව බලන්න

Department of Examinations Sri Lanka